# ගැලීලියෝ හා පල්ලිය

ගැලීලියෝ විද්වතා හා කතෝලික පල්ලිය අතර වූ ප්‍රශ්නය බොහෝ දෙනා අර්ථකථනය කර ඇත්තේ වැරදි ආකාරයකට ය. මේ අර්ථකථනයෙන් කියැවෙන්නේ කතෝලික පල්ලිය ගැලීලියෝ පඬිවරයාට වධ හිංසා කළ බව, ඔහුට තම අදහස් වෙනස් කර ගැනීමට කී බව හා පසුව තර්ජනය හමුවේ ඔහු තම අදහස් වෙනස් කරගෙන සූර්යයා පොළොව වටා යන බව පැවසූ බව ය. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් කලාකරුවාණන්ගේ ගැලීලියෝ නාට්‍යයේ ද  එවැනි අර්ථකථනයක් දෙන බව සඳහන් වෙයි. එහෙත් මෙය වැරදි තොරතුරු මත පදනම් වී කෙරෙන අර්ථකථනයකි. මේ පිළිබඳ පැහැදිලි විස්තරයක් ජෙරම් ලැන්ග්ෆර්ඩ් පූජකවරයා විසින් ලියන ලද ගැලීලියෝ විද්‍යාව හා පල්ලිය (ගැලීලියෝ, සයන්ස් ඇන්ඩ් චර්ච්) නම් කෘතියෙහි සඳහන් වෙයි.

කතෝලික පල්ලිය මේ සිද්ධියේ දී මුළුමනින් ම නිවැරදි නොවී ය. එහෙත් කතාව පසුව ලියන ලද්දේ පල්ලිය සම්පූර්ණයෙන් ම වරදකරු වන ආකාරයෙන් ය. එයට හේතුව කතාව ලියූවන් වෙනත් චින්තනයකට අයත් වීම ය. ගැලීලියෝ පඬිතුමා ජීවත් වූයේ දහසයවැනි දහහත්වැනි සියවස්වල ය (1564 - 1642). ඔහු වඩාත් ම කැපී පෙනෙන චරිතයක් බවට පත් වූයේ දහහත්වැනි සියවසේ දී ය. මේ සියවස කතෝලික චින්තනය හා යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය අතර වූ අරගලය උච්චස්ථානයකට පැමිණි යුගය විය. කතෝලික චින්තනය වෙනුවට යුදෙව් ග්‍රීක චින්තනය පෙරට ඒම පහළොස්වැනි සියවසේ ඇරඹිය ද එය ආගමික ස්වරූපයක් ගත්තේ මාර්ටින් ලූතර් නම් පූජකවරයා 1517 දී කතෝලික පල්ලියට අභියෝග කිරීමත් සමග ය. ලූතර්, කැල්වින් හා ස්වින්ග්ලි යන පූජකවරු හා ඔවුන්ගේ අනුගාමිකයෝ යුරෝපයේ විවිධ රටවල කතෝලික පල්ලිය විවේචනය කරමින් රෙපරමාදු ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ඉදිරියට ගෙන ගියහ. යුරෝපය දේශපාලනික වශයෙන් ගත් කල ස්වාධීන රාජ්‍ය බවට පත්වීම ආරම්භ කර තිබුණි. ආර්ථික වශයෙන් ගත් කල තවමත් ධනපති පංතියක් යැයි කිව හැකි කොටසක් බිහි නොවී තිබුණත්, වෙළෙඳ පංතියක් බිහි වී තිබුණි. ෂේක්ස්පියර් පඬුවා විසින් ලියන ලද වැනීසියේ වෙළෙන්දා වැනි කෘතියක මේ වෙළෙඳ පංතියේ බිහි වීමත් ඔවුන් කෙරෙහි සමාජයෙහි තිබූ විරෝධයත් පිළිබිඹු වෙයි.

මේ සියල්ල මෙහි දී මා සඳහන් කරන්නේ ඒවා එකිනෙකට බැඳී තිබුණු බැවිනි. පටිච්චසමුප්පාදය ගැන කතාකරන විට අවිද්‍යාවෙන් පටන් ගැනෙයි. එහෙත් අවිද්‍යාව මූල හේතුවක් නොවේ. අපේ චින්තනයෙහි මනස ගැන කියැවෙන දේ හැරුණු විට මූල හේතු නැත. මනස පවා චක්‍රීය ආකාරයකට තේරුම් ගැනීමට හැකි ය. දිවයින ඉරිදා සංග්‍රහයට මා විසින් ලියන ලද සිංහල බෞද්ධ මනස නම් ලිපියෙහි ඒ පිළිබඳ විස්තරයක් වෙයි. අපේ ප්‍රවාදවල ද මූල හේතු නැති වුව ද යම් තැනකින් පටන් ගැනීමට සිදුවේ. පටිච්චසමුප්පාදය අවිජ්ජා පච්චයා සංඛාරා යනුවෙන් අවිද්‍යාවෙන් පටන් ගැනෙයි. එලෙසින් අපි චින්තනයෙන් පටන් ගනිමු. එහෙත් චින්තනය, සංස්කෘතිය, ආර්ථිකය, දේශපාලනය ආදිය එකිනෙකට බැඳී ඇත. චින්තනය මනස සමග සම්බන්ධ වෙයි. මාක්ස්වාදය සියල්ල ආර්ථිකය නම් මූල හේතුවට ඌනනය කිරීමට උත්සාහ කරයි. එයට හේතුව මාක්ස්වාදය ද යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය මත පදනම් වීම ය. යුරෝපයේ පහළොස්වැනි දහසයවැනි සියවස්වල වූ පෙරළිය එසේ ආර්ථිකය මත පදනම් වී තේරුම් ගත නොහැකි ය. මේ වකවානුවෙහි හරි හමන් ධනපති පංතියක් බිහි වී නොතිබුණි. එහෙත් ධනපති විප්ලවය එවකටත් ආරම්භ වී තිබුණේ මාක්ස්වාදයට අභියෝග කරමිනි. බටහිර යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය මූල හේතුවක් මත පදනම් වන ඒක රේඛීය වූවකි. අපේ චින්තනය මූල හේතුවක් නොමැති චක්‍රීය වූවකි. එහි මූල හේතුවක් වෙනුවට එකට බැඳුණු හේතු ගණනාවක් වෙයි.

ගැලීලියෝ පඬිතුමා පිළිබඳ කතාවෙහි වැරදිකරු ලෙස කතෝලික පල්ලිය සඳහන් වන්නේ කතාව ලියූ අය ඒ සිද්ධියට පසුව  අධිපතිවාදී චින්තනය බවට පත් වූ යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයට අයත්වන බැවිනි. ලංකාවේ උතුර සම්බන්ධයෙන් ගත් කල සිංහල බෞද්ධයන් වැරදිකරු ලෙස නිතර ම සඳහන් වන්නේ ද ඒ කතාව ලියන්නන් ද යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයට අයත්වීම නිසා ය. ලැන්ග්ෆර්ඩ් පූජකවරයා මෙන් ම ෆෙයරාබන්ඩ් මහතා ද පෙන්වා දී ඇති ආකාරයට ගැලීලියෝ පඬිවරයාට සූර්ය කේන්ද්‍රවාදය තහවුරු කිරීමට තරම් සාධක නොවී ය. ඔහු කෙළේ ඇරිස්ටෝටලීය මතයට විරුද්ධ ව කරුණු ඉදිරිපත් කිරීම හා පොළොව තම අක්ෂය වටා කැරකැවෙමින් සූර්යයා වටා ගමන් කිරීමට ඉඩ ඇති බව පෙන්වීම ය. ඔහුට අවශ්‍ය වී තිබූ තාරකා අසම්පාතය පෙන්නුම් කිරීමට බටහිර

© Prof. Nalin De Silva

විද්‍යාඥයන්ට හැකි වුයේ ඔහු මියගොස් බොහෝ කාලයකට පසුව ය. ඇරිස්ටෝටලීය මතය අභියෝගයට ලක්කිරීමට ගැලීලියෝ විද්වතා සමත් වුණ ද, තම මතය තහවුරු කිරීමට අවශ්‍ය සාධක සැපයීමට ඔහු අසමත් විය.

කතෝලික පල්ලිය සූර්ය කේන්ද්‍රවාදයට මුළුමනින් ම විරුද්ධ වීය යන්න අසත්‍යයකි. පල්ලියට ඒ පිලිගැනීමට තරම් අවශ්‍ය සාධක නොමැති වීම එහි දී බල පෑ ප්‍රධාන ම කරුණ විය. ඇතැම් කාදිනල්වරු ඒ මතය පිලිගැනීමට සූදානමින් සිටියෝ ය. එපමණක් නොව අවසානයේ දී ගැලීලියෝ පඬිවරයාට විරුද්ධ ව නඩුව විභාග වූ කාලයෙහි පාප් පදවිය දරා ඇති ඔහුගේ හිතවතකු වූ අර්බන් පාප් වහන්සේ ද ඇතුළු බොහෝ දෙනකු ගැලීලියෝ පඬිවරයාට ඉතා ලිහිල් ආකාරයකින් සලකා ඇත. බයිබලයට අනුව සූර්යයා පොළොව වටා යා යුතු නමුදු පොළොව චලනය වන්නේ ය යන්න සඳහා ද බයිබල් අර්ථකථනයක් දීම අපහසු කරුණක් නොවී ය. ගැලීලියෝ පඬිවරයා ද බයිබලය ඇතුළු ආගමික ලේඛනවල නිරවද්‍යතාවය පිළිගත්තේ ය. ඔහු තම මතය වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීමේ දී ද ඒ ලේඛන උපුටා දැක්විය. අර්බන් පාප්වහන්සේ සාධනීය ආකාරයකින් නොවුව ද සාපේක්ෂතාවාදියෙක් විය. එතුමා කියා සිටියේ දෙවියන් වහන්සේ ලෝකය මවා ඇති ආකාරය කිසිවකුටත් මුළුමනින් ම තේරුම් ගත නොහැකි බව ය. එබැවින් එතුමාට අනුව ඇරිස්ටෝටලීය මතවාදය ද ඇතුළු කිසිම මතවාදයක් මුළුමනින් ම සත්‍ය නොවී ය. මේ ආකල්පයට අනුව දේව ධර්මය හැරුණු කොට වෙනත් අවස්ථාවල දී විවිධ මත පිළිගැනීමට බාධාවක් නොවී ය. පල්ලිය ගැලීලියෝ පඬිවරයාට සවන් දීමට සූදානමින් සිටියේ ය.

භාරතීය සාපේක්ෂතාව යුරෝපයට හඳුන්වා දුන්නේ ගැලීලියෝ විද්වතාණන් වුව ද, එය ඔහු හඳුන්වා දුන්නේ යුරෝපීය ක්‍රමයකට ය. එනම් යුදෙව් ග්‍රීක චින්තනය තුළ ය. මුල් යුදෙව් චින්තනය පදනම් කරගත් චින්තනවල කිසිදු සාපේක්ෂතාවකට ඉඩක් නොවී ය. අද පවා එහි එවැනි ඉඩක් නැත. අයින්ස්ටයින් විද්වතාණන්ගේ සාපේක්ෂතාවාදය වුව ද, මුළුමනින් ම සාපේක්ෂතාවාදයක් නොවේ. එහි ද නිරපේක්ෂයක් වෙයි. එහි අවකාශය හා කාලය වෙන වෙන ම ගත් කල ඒ ඒ නිරීක්ෂකයාට සාපේක්ෂ වුව ද, අවකාශ - කාලය යනු නිරපේක්ෂ වූවකි. යුදෙව් චින්තනය මුල් කර ගත් චින්තනවලට සාපේක්ෂතාව ආගන්තුක වූවකි. ගැලීලියෝ විද්වතාට ද නිරපේක්ෂ චලිතයක් විය. ඔහු එය මනින්නේ කෙසේ දැයි නොකීව ද එය සූර්යයාට සාපේක්ෂ චලිතය බව පැහැදිලි ය. ඔහු කෙළේ එතෙක් පොලොවට නිරපේක්ෂ ව ගත් චලිතය සූර්යයාට නිරපේක්ෂව ගැනීමකි. ඔහු කියා සිටියේ අපට නිරීක්ෂණය කළ හැක්කේ ඒ නිරපේක්ෂ චලිතයෙහි අපට සාපේක්ෂ වූ චලිතය (සංරචකය) පමණක් බව ය. අර්බන් පාප් වහන්සේ සාධනීය ආකාරයකින් නොවුව ද වඩා හොඳ සාපේක්ෂතාවාදියෙක් වී යැයි සිතමි. එතුමාට අනුව කිසිම ප්‍රවාදයක් විසින් දෙවියන් වහන්සේ හා උන්වහන්සේ ලෝකය මවා ඇති ආකාරය මුළුමනින් ම තේරුම් නොගන්නා බැවින් කිසිම ප්‍රවාදයක් මුළුමනින් ම නිවැරදි නොවී ය.

ගැලීලියෝ විද්වතාණන් භාරතීයයන් මෙන් පොළොවට සාපේක්ෂ චලිතය මෙන් ම සූර්යයාට සාපේක්ෂ චලිතය ද නිවැරදි යැයි ගැනීමට අකමැති විය. ඇතැම් විට කතෝලික පල්ලිය එයට සූදානමින් සිටින්නට ඇතැයි පාප් වහන්සේ දැරූ අදහසින් නිගමනය කළ හැකි වෙයි. කිසිම ප්‍රවාදයක් මුළුමනින් ම නිවැරදි නොවන බැවින් සෑම ප්‍රවාදයක ම ගත යුත්තක් ඇත යන අදහසට කතෝලික පල්ලියට නැඹුරු වීමට ඉඩක් විය. කතෝලික චින්තනය භාරතීය වෛදික චින්තනය මෙන් ම ත්‍රිකෝටික න්‍යාය මත පදනම් වෙයි. දෙවියන් වහන්සේ හා සම්බන්ධ දේවධර්මවාදයෙහි හැරෙන්නට වෙනත් අවස්ථාවල, එකක් පමණක් සත්‍ය වේ අනෙක් සියල්ල අසත්‍ය වේ යන ආකල්පයක් ත්‍රිකෝටික න්‍යායෙහි නොවෙයි. එහෙත් ග්‍රීක ද්විකෝටික න්‍යායෙහි එකක් සත්‍ය නම් එහි විරුද්ධය අසත්‍ය වෙයි. නිරපේක්ෂ චලිතය සිදුවන්නේ සූර්යයාට සාපේක්ෂ ව නම් එය පොළොවට සාපේක්ෂව සිදු නොවෙයි. (කලින් සඳහන් කර ඇති පරිදි සූර්යයාට සාපේක්ෂ චලිතය යනු සූර්යයාට නිරපේක්ෂ චලිතය වෙයි.) යුදෙව් චින්තනයෙහි මෙන් ම ග්‍රීක චින්තනයෙහි ද නිරපේක්ෂතාව වෙයි.

ගැලීලියෝ පඬිවරයා කතෝලික චින්තනය වැඩි දියුණු කර සාපේක්ෂතාවාදයක් නිර්මාණය නොකෙළේ ය. ඔහු ඒ වෙනුවට එකල යුරෝපයට අවශ්‍ය ව තිබූ යුදෙව් ග්‍රීක චින්තනය නිර්මාණය කර ගැනීමට අවශ්‍ය අන්දමට කටයුතු කෙළේ ය. ඔහු චලිතය, එනම් ඔහුට අනුව නිරපේක්ෂ චලිතය, සූර්යයාට සාපේක්ෂ යැයි කීමෙන් කෙළේ පොලොවට සාපේක්ෂ ලෙස එතෙක් ගැණුනු නිරපේක්ෂ චලිතය බැහැර කිරීම ය. එහෙත් සූර්යයාට සාපේක්ෂව පොළොව චලනය වන්නේ යැයි පෙන්නීමට තරම් අවශ්‍ය සාධක ඔහුට නොවී ය. කතෝලික පල්ලිය කෙළේ මේ සාධක ඉල්ලීම ය. සාධක නොමැති ව කොපර්නිකස්වාදය ප්‍රචාරය නොකරන ලෙස, නූගන්වන ලෙස හා නොදරන ලෙස පල්ලිය ගැලීලියෝ

© Prof. Nalin De Silva

විද්වතාණන්ට නියම කෙළේ ය. එහෙත් ගැලීලියෝ විද්වතා එයට කන් නොදුන්නේ ය. අවුල පැන නැගුනේ එලෙස ය. පල්ලිය ගැලීලියෝ විද්වතාණන්ට තම සංවාදය (ඩයලොග්) යන කෘතිය පළ කිරීමට ද අවසර දී ඇත. එහෙත් ලැන්ග්ෆර්ඩ් පූජකවරයා සඳහන් කරන ආකාරයට ගැලීලියෝ විද්වතා සීමාව ඉක්මවා ක්‍රියා කෙළේ ය. ඔහු ඒ කෘතියෙන් ප්‍රමාණවත් සාධක නොමැති ව කොපර්නිකස්වාදය ඉගැන්වීමට හා ප්‍රචාරය කිරීමට කටයුතු කෙළේ ය යන්න කතෝලික පල්ලියේ නිගමනය විය.

ගැලීලියෝ පඬිවරයා හා කතෝලික පල්ලිය අතර වූ අරගලය ආගමික අරගලයක් නොවී ය. එය ලූතර්වාදී හෝ කැල්වින්වාදී හෝ ප්‍රතිසංස්කරණයක් නොවි ය. ගැලීලියෝ විද්වතා මිය යන තුරු ම භක්තිමත් කතෝලිකයෙක් විය. ඔහු කොපර්නිකස්වාදය වෙනුවෙන් ඉතා දැඩි ව පෙනී නොසිටින්නට ඇතැම් විට කතෝලික පල්ලිය ඒ දිනවල හෝ ටික කලකට පසුව පොළොව චලනය වන බව පිළිගැනීමට ද තිබුණි. එහෙත් ගැලීලියෝ පඬිවරයා, ඇතැම් විට දඩබ්බරශීලී යැයි කිව හැකි, දැඩි මතධාරියෙක් විය. ඔහු පෙනී සිටියේ යුරෝපයේ ඇති වෙමින් තිබූ නව චින්තනය වෙනුවෙනි. කතෝලික පල්ලිය පැරණි චින්තනයේ ආරක්ෂකයා විය. නව චින්තනයක කොටස්කරුවකු වූ ගැලීලියෝ පඬිවරයාට තර්කය හා සාධක ඉක්මවා කරුණු තේරුම් ගැනීමට හැකි අන්තර්ඥානයක් තිබුණි. අන්තර්ඥානයක් නැති කිසිවකුට නිර්මාණ කළ නොහැකි ය. කවියක් කෙටි කතාවක් වුව ද නිර්මාණය කළ හැක්කේ අන්තර්ඥානයක් ඇත්තෙකුට ය. ප්‍රවාද ද නිර්මාණය කෙරෙයි. තර්ක හා සාධක ද කිසියම් ප්‍රවාදයක් සමග සංගත වන සාපේක්ෂ දෑ මිස බොහෝ දෙනා සිතන අයුරින් නිරපේක්ෂ දෑ නොවේ. යම් කාලයක වලංගු තර්ක හා සාධක ඉක්මවා යන ආකාරයෙන් තවමත් තර්ක හා සාධක නිර්මාණය කෙරී නොමැති ප්‍රවාදයකට සංගතවන ආකාරයකට ලෝකය දෙස බැලිය හැක්කේ ඉතාමත් ඉහළ ගණයේ ප්‍රාඥයන්ට ය. ගැලීලියෝ ගැලීලි එවැනි අග්‍රගණ්‍ය ප්‍රාඥයෙක් විය. ඔහු ලෝකය දෙස බැලුවේ එවකට නිර්මාණය වී නොතිබුණු නිව්ටෝනීය යාන්ත්‍රිකයට සාපේක්ෂව ය. තම අන්තර්ඥානය ගැන දැඩි විශ්වාසයක් තිබූ එතුමාට කතෝලික පල්ලියට මෙන් නොව ඊනියා සාධක වැදගත් සාධකයක් නොවී ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva